## සතිපොළ කඩකාමර / බිම් අල්ලි ලබා දීමේ අභ්‍යන්තර ප්‍රත්පත්තිය.

ප්‍රතිපත්තියේ නම :- කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සතිපොළ කඩකාමර / බිම් අල්ලි ලබා දීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය වේ.

**හැඳින්වීම**

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කර පවත්වාගෙන යනු ලබන සතිපොළ 02කි.

01) ඌරගස්මංහන්දිය සතිපොළ
02) මහඒදණ්ඩ සතිපොළ

මෙම සතිපොළ සභාවේ ප්‍රධාන ආදායම් උත්පාදන ප්‍රභවයක් වන අතර මෙම පොළ වඩාත් ජනතාවාදී අයුරින් හා වෙළඳ ප්‍රජාවටද පහසුව සැලසෙන පරිදි පවත්වා ගෙන යාම ප්‍රාදේශීය සභාවේ ප්‍රමුඛ අරමුණ වේ.එහිදී සියළු ප්‍රජාව සතිපොළ කටයුතු වලදී සමාජ අන්තර්කරණය මගින් සම්බන්ධ කිරීම හා සේවා සැපයීම අරමුණ පහත නිර්ණායක සහිතව අභ්‍යන්තර ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කරන ලැබේ.

**අරමුණු**

1.සතිපොළ වෙළඳ අයිතිය සභාව තීරණය කරන පරිදි වාර්ෂිකව බදු දීම හෝ සභාවේ සේවකයින් යොදවා බදු එකතු කිරීම සහ ක්‍රමවේද ඔස්සේ පවත්වා ගෙන යනු ලැබේ.

2.සෑම වෙළෙන්දෙකුටම සමාන වර්ග අඩි ප්‍රමාණයකින් යුතු කඩකාමරයක් හෝ බිම් අල්ලියක් වෙන් කර දෙන අතර වෙළඳාමේ ස්වභාවය අනුව සලකා ඉල්ලීමක් ලද හොත් ලබා දෙන කඩකාමර ප්‍රමාණය (පොළ පරිශ්‍රයේ පවතින කඩකාමර ප්‍රමානය මත සලකා) වැඩි කිරීමට සලකා බලනු ලැබේ.

3.පොළ කඩකාමර හෝ පොළ පරිශ්‍රය තුළ මත්පැන් / මත්වැටි / රසායනික ද්‍රව්‍ය / රසායනික පොහොර / වස විෂ වෙළඳාම සපුරා තහනම් කිරීම.

4.පොළ වෙළඳුන් වෙළඳාමේ නොයෙදෙන දිනක් වෙනුවෙන් සභාව කලින් තීරණය කර බදු මුදලක් ගෙවිය යුතු වේ.ඒ වෙනුවෙන් සභාපති බලය පැවරීම මත නිලධාරී / බදුකරු විසින් ලදුපත් නිකුත් කරනු ලැබේ.

5.ලබා දෙන කඩකාමර සතිපොළ දින වෙළඳාම් සඳහා පමණක් වන අතර එය වෙළඳාම් කරන අයගේ දිගුකාලීන අයිතියකට හෝ හිමිකම් පෑමකට වලංගු නොවේ.

6.සතිපොළ පරිශ්‍රය තුළ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන කසළ කළමනාකරණ සැලැස්මක් පැවතිය යුතු අතර ඊට වෙළඳ ප්‍රජාව අවනතව ක්‍රියා කළ යුතු වේ.

7.සෑම විටම පාරිභෝගික හිතකාමී පරිසරය තුළින් වඩාත් යහපත් සේවාවක් පාරිභෝගිකයන්ට ලබා දීමට ප්‍රාදේශීය සභාව උත්සුක වේ.

8.කඩකාමර ලබා දීමේ දී සෙසු වෙළඳ ප්‍රජාව ඉක්මවා ගිය ප්‍රමුඛතාවයන්ගෙන් පහත සඳහන් වෙළඳාම් සඳහා ලබා දීම ප්‍රතිපත්තියක් ලෙස සලකමි.

I. විශේෂ අවශ්‍යතා සහිත ව්‍යවසායකයින්

II.සමෘද්ධිලාභී හෝ අඩු ආදායම්ලාභී ප්‍රජාව

III.කාන්තා ව්‍යවසායකයින්

IV.ස්වයං රැකියා මගින් සිය නිෂ්පාදන අලෙවිකරුවන්

9.සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට කඩකාමර / බිම් අල්ලි ලබා දීමේ දී බල ප්‍රදේශයේ පිටත වෙළඳුන්ට පෙර ප්‍රමුඛතාවන් හිමි කර දෙනු ලැබේ.

10.පොළ පරිශ්‍රයේ සභාව ඉදිකල ඉදිකිරීම ඉක්මවා යන පරිදි වෙනත් තාවකාලික / ස්ථිර ඉදිකිරීම් සිදු කිරීමට අවකාශය ලබා දෙනු නොලැබේ.

11.සතිපොළ පරිශ්‍රයේ සාමය ආරක්ෂා කිරීම සභාවේ සේවකයින් / බදුකරුවන් / වෙළඳුන් / පාරිභෝගිකයින් සහ සියළු පාර්ශව වෙත පැවරුණු පොදු වගකීමක් ලෙස සැලකේ.

12.බාලවයස්කරුවන් වෙළඳාම් හෝ වෙළඳ පරිශ්‍රයක සේවයට යොදවා ගැනීමට අවසර ලබා නොදෙනු ලැබේ.

2023/01/01 දින සිට මෙම අභ්‍යන්තර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**ලේකම්,**
**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.**